# මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුරට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2023

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුරෙහි පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පැවැත්වීමට නියමිත සීමිත තරග විභාගය සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නිරත, අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. පොදු සුදුසුකම්

1.1 අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
1.2 අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
1.3 සෑම අයදුම්කරුවෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
1.4 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
1.5 දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් නොලැබූ අයකු විය යුතුය.
1.6 රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ අසාධු ලේඛනයට නම ඇතුළත් නොවූ අයෙකු විය යුතුය.

## 2. අධ්‍යාපන සුදුසුකම්

සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන **2023.02.20** දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

(1) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති උසස් අධ්‍යාපන ආයතනයකින්, පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

හෝ

(2) i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති උසස් අධ්‍යාපන ආයතනයකින්, පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් සහිත උපාධියක් ලබා තිබීම. (මෙහිදී සම්පූර්ණ උපාධියෙන් අවම වශයෙන් 1/3 කොටසක් පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳව විය යුතුය.)

සහ

ii. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති උසස් අධ්‍යාපන ආයතනයකින්, පරිගණක විද්‍යාව තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

හෝ

(3) i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති උසස් අධ්‍යාපන ආයතනයකින්, උපාධියක් ලබා තිබීම.

සහ

ii. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති උසස් අධ්‍යාපන ආයතනයකින්, පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම .

හෝ

(4) i. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා (NVQ) (07) මට්ටම හෝ ඊට ඉහළ NVQ සහතිකයක් ලබා තිබීම .

සහ

Ii අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**3. වැටුප**

අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි සේවයේ 2 පන්තියේ II හා I වන ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය MN 6 - 2016 : රු. 36,585 -10x660 - 11 x755 - 15x 930 – රු. 65,440 ක් වන අතර, එම වැටුප පත්වීම ක්‍රියාත්මක වන දින සිට ගෙවනු ලැබේ.

මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාද ඔබට හිමිවේ.

**4. බඳවා ගැනීමේ කොන්දේසි.**

මෙම තනතුරට අදාළව අනුමත කර ඇති බඳවා ගැනීමේ පරිපාටිය අනුව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගැනීමේ කොන්දේසි තීරණය කරනු ලබයි.

**5. බඳවා ගැනීමේ ක්‍රමය.**

පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන 100% ක් සීමිත බඳවා ගැනීම යටතේ සිදු කරනු ලැබේ. උක්ත අංක 2 යටතේ දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කරන ලද මධ්‍යම පළාත් ස්ථිර රාජ්‍ය සේවයේ සිටින නිලධාරින් ඔවුන්ගේ පෙර සේවයට අගතියක් නොවන පරිදි පමණක් තරග විභාගයට ඇතුළත් කරනු ලැබේ. අපේක්ෂකයන්ට සිය මනාපය පරිදි එක් භාෂා මාධ්‍යයකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැක. විභාගයේ එක් එක් විෂය සාමාර්ථය සඳහා මුළු ලකුණු වලින් අවම වශයෙන් 40% ලබා ගත යුතුය. සීමිත ලිඛිත තරග විභාගයේ ප්‍රතිඵල මත පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකින් අදාළ සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සීමිත ලිඛිත විභාගයෙන් ලබා ගත් මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගනු ලැබේ.

**6. සේවා කොන්දේසි.**

6.1. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම පිරවීමට හෝ නොපිරවීමට මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

6.2. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලටද, 2019.09.04 දින ගරු මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය මගින් පනවා ඇති නියමයන් හා කොන්දේසිවලටද, එම සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අදාළව සිදු කර ඇති හෝ මින් මතු සිදු කරන සංශෝධනවලටද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලටද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයෙකු මධ්‍යම පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

6.3. මෙම තනතුර ස්ථිරය විශ්‍රාම වැටුප් සහිතය. මධ්‍යම පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි 2 පන්තියේ I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගතවීමට පෙර දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද, සමත්විය යුතුය.

6.4. අදාළ පත්වීම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුශාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධානයන්ට යටත් වේ.

6.5. සන්ධාන භාෂාව : 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගන්නා නිලධාරීන් බඳවා ගෙන වසර තුන (03) ක් තුල අ.පො.ස. (සා පෙළ) සම්මාන සාමාර්ථයක් ලබාගත යුතුය.

## 7. අයදුම් කිරීමේ ක්‍රමය.

7.1. විභාග ගාස්තුව රු. 600/-කි. මෙම විභාග ගාස්තුව මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන පරිදි මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අයදුම්කරුගේ නමින් ගෙවා ඒ සඳහා ලබා ගත් නිල් පැහැති ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. වෙනත් ශීර්ෂයකට ගෙවීම් කරන ලද කුවිතාන්සි හෝ මධ්‍යම රජයට අයත් කහ පැහැති කුවිතාන්සි අලවා ඇතොත් එම අයදුම්පත ප්‍රතික්ෂේප කරන අතර ගෙවන ලද විභාග ගාස්තුව කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

7.2. මෙම නිවේදනය සමඟ අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ දැනට දරන තනතුරට අදාළ පත්වීම් ලිපියේ ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද පිටපත හා නියමිත අධ්‍යාපන සුදුසුකම් සනාථ කරන සහතිකවල පිටපත් සමඟ 2023.02.20 දිනට පෙර ලැබෙන සේ "ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුරට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2023**" ලෙස සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වග කියනු නොලැබේ.

## 8. විභාග මාධ්‍යය

විභාගය සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අයදුම්පත්‍රයේ තමන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයට නියමිත අක්ෂරය පැහැදිලිව සඳහන් කළ යුතු අතර, එය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

## 9. විභාග මධ්‍යස්ථානය

මෙම විභාගය මහනුවර නගරයේදී පමණක් හෝ අයදුම්කරුවන් සංඛ්‍යාව හා ඔවුන්ගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය අනුව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි පැවැත්වේ. මේ පිළිබඳව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍රය මඟින් දැනුම් දෙනු ලැබේ.

## 10. ලිඛිත විභාගය හා විෂය නිර්දේශය

අයදුම්කරුවන් මෙම තනතුරට බඳවා ගැනීම සඳහා පහත සඳහන් විෂය නිර්දේශයන් යටතේ ලිඛිත විභාගයකට යොමු කරනු ලැබේ.

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | විභාග අපේක්ෂකයා සතු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මූලධර්ම පිළිබඳ දැනුම, පරිගණක නිර්මිතිය හා මෙහෙයුම් පද්ධති/මෘදුකාංග/ දෘඩාංග පිළිබඳ දැනුම, e රාජ්‍ය (e – Gov) සංකල්පය වඩාත් ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම, තොරතුරු පද්ධති විශ්ලේෂණය, නිර්මාණය, පරීක්ෂණය, ස්ථාපනය හා නඩත්තු කටයුතු (System Analysis, Design, Testing, Implementation and Maintenance) පිළිබඳ දැනුම, දත්ත සමුදාය (Data Base) නිර්මාණය හා කළමනාකරණය පිළිබඳ දැනුම, දෘඩාංග, දත්ත සන්නිවේදනය හා පරිගණක ජාල, අන්තර්ජාලය, වෙබ් අඩවි නිර්මාණ සහ නව අන්තර්ජාල සේවාවන්, ඉලෙක්ට්‍රොනික තැපෑල, තොරතුරු සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති ජීවන චක්‍රය ආදී ක්ෂේත්‍ර පිළිබඳ දැනුම හා අධීක්ෂණ හැකියාව ගැඹුරු ලෙස පරීක්ෂා කරනු ලබන ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. |

| | |
|---|---|
| 2. අභියෝග්‍යතාව | විභාග අපේක්ෂකයාගේ සංඛ්‍යා ලේඛනාත්මක හැකියාව සහ තර්කානුකූල කරුණු දැක්වීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයට අඩංගු වේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න පනහකින් (50) සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |
| 3. සාමාන්‍ය බුද්ධිය | සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කරගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න වලින් සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |

**11.** අයදුම්පත් පිරවීම සඳහා උපදෙස්

ආදර්ශ අයදුම්පත් ආකෘතිය ප්‍රකාර A 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිතා කරමින් අයදුම්පත සකස් කර ගත යුතුය. අයදුම්පතේ ශීර්ෂ අංක 01 සිට 03 තෙක් පළමුවන පිටුවට ද, 04 සිට 06 තෙක් දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවට ද ඇතුළත්වන සේ අයදුම්පත සකස් කර ගත යුතුය. අයදුම්පත්‍රය යතුරු ලියනය කර ගැනීමෙන් හෝ පැහැදිලි අත් අකුරින් සකස් කර ගත යුතුය.

**12.** අයදුම්කරුවෙකුට බඳවා ගැනීමේ දැන්වීම ප්‍රකාරව සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර හෝ පත්වීම් ලබා දීමෙන් පසු හෝ ඕනෑම අවස්ථාවකදී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කෙරෙනු ඇත. එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත්කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

**13.** අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරු පත්වීම ලැබීම සඳහා තෝරාගනු ලැබී නම් ඔහු / ඇය මුදාහැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා එකඟ විය යුතුය.

**14.** අයදුම්කරුගේ අනන්‍යතාවය -

අයදුම්කරුවන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි, ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් පමණක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

**15.** මෙම විභාග නිවේදනයට අනුව විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.

**16.** මෙහි සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර, කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතුය.

2023 ජනවාරි මස ....27.......වෙනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත් සභාව.

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**<u>මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුරට</u>**
**<u>බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2023</u>**

ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය -
සිංහල -1
දෙමළ -2
ඉංග්‍රීසි -3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

**1.0 1.1** සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්): ........................................................................
............................................................................................................................
............................................................................................................................

**1.2** සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) : ........................................................................
............................................................................................................................
............................................................................................................................

**1.3** මුලකුරු සමග නම (ඉංග්‍රීසියෙන්) :- ........................................................................
............................................................................................................................

**2.0** සේවා ස්ථානය හා ලිපිනය:

**2.1** කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
............................................................................................................................
............................................................................................................................

**2.2** කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්):
............................................................................................................................
............................................................................................................................

**2.3** සේවයේ නියුතු ආයතනයේ/කාර්යාලයේ නිල විද්‍යුත් ලිපිනය (විභාග ප්‍රවේශපත්‍රය එවීම සඳහා):

............................................................................................................................

**3.0 3.1** ස්ත්‍රී / පුරුෂ භාවය: **(ස්ත්‍රී-1 පුරුෂ-0)**

(අදාල අංකය කොටුව තුල ලියන්න)

**3.2** උපන් දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

**3.3** ජාතික හැඳුනුම්පත් අංකය:-

**3.4** ජංගම දුරකථන අංකය :-

**3.5** ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- ..........................................

**4.0** සේවා විස්තරය

4.1. ඔබ දැනට සේවය කරන ආයතනයේ නම : ..............................................................................................................................................................................

4.2. එය අයත් වන දෙපාර්තමේන්තුව හෝ අමාත්‍යාංශය : ..............................................................................................................................................................................

4.3. ඔබගේ පෞද්ගලික ලිපිගොනුව පවත්වාගෙන යන කාර්යාලය සහ ආයතන ප්‍රධානියා පැහැදිලිව සඳහන් කරන්න:..............................................................................................................................................................................

4.4 දැනට දරණ තනතුරේ පදවි නාමය : .............................................................

4.5 දැනට දරණ තනතුරට පත්වූ දිනය : ..........................................................

4.4. සේවය ස්ථිර කළ දිනය : ..........................................

4.5. වැටුප් පරිමාණය : ......................................................................

**(අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව)**

4.6. දැනට දරන පත්වීම විශ්‍රාම වැටුප් සහිතද යනවග : ...........................................

4.7. 2023.02.20 දිනට දැනට දරන තනතුරේ සේවා කාලය : ...................................

**5.0** අධ්‍යාපන සුදුසුකම්

| විශ්ව විද්‍යාලයේ හෝ ආයතනයේ නම | ලබා ඇති උපාධිය හෝ සමත් විභාගය | උපාධියට හෝ විභාගයට හදාරා ඇති විෂයන් | කාල සීමාව | සාමාර්ථය | සහතිකපත් අංකය හා දිනය |
|---|---|---|---|---|---|
| | | | | | |

6.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

6.1 ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ..................................................................

6.2 ලදුපත් අංකය හා දිනය : ..........................................................................

6.3 ගෙවූ මුදල : ..........................................................................................

| |
|---|
| නිල් පැහැ ලදුපත මෙහි අලවන්න. |

මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සෙකු කිරීමටත්, පත්කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමටත් හැකි බව මම දනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට හා විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද මෙයින් ප්‍රකාශ කරමි.

................................ ...................................................

දිනය අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අත්සන
(ආයතන ප්‍රධානියා ඉදිරිපිටදී)

<u>අත්සන සහතික කිරීම</u>

මෙම අයදුම්පත ඉදිරිපත් මාගේ කාර්යාලයේ නිලධාරියෙකු /නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන .................................. මහතා/මහත්මිය/මෙනවිය ................................වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි.

...................................................
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව

දිනය : ...............................................................
නම : ...............................................................
පදවි නාමය : ...............................................................
ලිපිනය : ...............................................................

**<u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය:</u>**

1. මෙම අයදුම්කරු/ අයදුම්කාරිය වන ...................................................................... මහතා/ මහත්මිය/ මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුතු අයකු බවද,
2. ඔහු/ ඇය ස්ථිර **2023.02.20** වැනි දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක **01/2020** හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොමැති බවද,
5. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව, පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරනු ලබන බවද,
6. විභාග ගාස්තු වශයෙන් රු. **600/-** ක් ගෙවා ලදුපතක් අයදුම්පත්‍රයේ අලවා ඇති බවද,
7. ඔහුගේ/ ඇයගේ අයදුම්පතෙහි දැක්වෙන විස්තර මෙම ආයතනයේ ඇති ලේඛන සමග හරි වැරදි බලා ඇති බව සහ මෙම විභාගයට අදාළ විභාග නිවේදනයේ දැක්වෙන රෙගුලාසි අනුව, මෙම විභාගයට පෙනී සිටීමට ඔහු/ ඇය සුදුසු බවද, මම සහතික කරමි.

**( අනවශ්‍ය වචන කපා හරින්න)**

...................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය : ...............................................................
නම : ...............................................................
පදවි නාමය : ...............................................................
ලිපිනය : ...............................................................